# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි / අගෝස්තු

**සමාජීය විද්‍යා පීඨය**

## ජනසන්නිවේදනය

**සන්නිවේදනය හා මාධ්‍ය ඉතිහාසය - MACO 18224**

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "ලෙන් සිතුවම් යනු මානවයාගේ මුල්ම සන්නිවේදන විධික්‍රමයකි." මෙම ප්‍රකාශය ලෙන් සිතුවම් ආශ්‍රිත ප්‍රධාන තේමාවන් සහ ඒවායින් ඉටුවූ සන්නිවේදන කාර්යභාරය ඇසුරෙන් විචාරාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 20)

02. ලාංකේය පුවත්පත් කලා ඉතිහාසයේ මුල් යුගය පිළිබඳව විවරණයක යෙදෙන්න. (ලකුණු 20)

03. "පෞද්ගලික ගුවන්විදුලි සේවාවන් හි ආගමනය මෙරට ගුවන්විදුලියේ දිශානතිය වෙනස් කිරීමට සමත් විය" නිදසුන් මගින්, මෙය පැහැදිලි කරන්න. (ලකුණු 20)

04. 1970 සිට 2000 දක්වා කාලය තුළ ලාංකීය සිනමාව පෝෂණය කළ සිනමාකරුවන් හතර දෙනෙකු පිළිබඳව ඔවුන්ගේ නිර්මාණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

05. හොලිවුඩ් සිනමා යුගය තුළ ක්‍රියාත්මක වූ ස්ටූඩියෝ පහ (Studio five) සහ ජනකාන්ත (Blockbuster) සංකල්පය මගින් ලෝක සිනමා කර්මාන්තය වාණිජකරණය වූ ආකාරය චිත්‍රපට හෝ සිනමාකරුවන්ගේ උදාහරණ ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 20)

06. "මෙරට රූපවාහිනී සේවාවන් ස්ථාපිත කිරීම පිළිබඳ කථිකාව ස්වාධීන රූපවාහිනිය ආරම්භයටත් එහා දිව යන්නකි." පැහැදිලි කරන්න. (ලකුණු 20)

07. 1960 දශකයේ ARPANET මූලාරම්භයේ සිට වර්තමාන ගෝලීය සමාජ මාධ්‍ය ජාල (Facebook, YouTube ආදී) දක්වා සන්නිවේදනයේ ඩිජිටල් පරිණාමය සිදුවූ ආකාරය සන්ධිස්ථාන ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් (04) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

    i. ගැඹුරු ව්‍යාජකරණය (Deepfake)
    ii. දිමුතුමුතු
    iii. කුනිෆෝම් ලේඛන කලාව
    iv. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (Sri Lanka CERT)
    v. ජර්මානු ප්‍රකාශනවාදය
    vi. කොත්මලේ ප්‍රජා ගුවන් විදුලිය
    vii. ජේම්ස් ක්ලාක් මැක්ස්වෙල් (ලකුණු 5x4=20)

************************************